| (7) | 2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව | ..... |
| (8) | 2020 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2021 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | ..... |
| (9) | 2021 වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ..... |
| (10) | 2021 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව<br>{(3+4+5) - (6+7)} - (8+9) | ..... |
| (11) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම්වල එකතුව | ..... |
| (12) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2021 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ..... |
| (13) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළහැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (10 + 11 - 12) | ..... |

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

**සටහන-(vi)**

# ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම** : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
**වැඩසටහන් අංකය හා නාමය** :2- සංවර්ධන ක්‍රියාකාරකම්

| | | රු. |
|---|---|---|
| (1) | ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2021 ඇස්තමේන්තුගත වෙන්කිරීම් | ..... |
| (2) | ඉහත (1) ට අදාළ 2021 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම | ..... |
| (3) | 2021 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව | ..... |
| (4) | 2020 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2021 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (ඇත්නම්) | ..... |
| (5) | 2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව | ..... |
| (6) | 2020 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2021 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව | **හිස් වාර්තාවකි** |
| (7) | 2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම්පෑම්වල එකතුව | ..... |
| (8) | 2020 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2021 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව | ..... |
| (9) | 2021 වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ..... |
| (10) | 2021 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (3+4+5) - (6+7) - (8+9) | ..... |
| (11) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම්පෑම්වල එකතුව | ..... |
| (12) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2021 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව | ..... |
| (13) | මූල්‍යප්‍ර කාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළහැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව(10 + 11 - 12) | ..... |

| | | | | |
|---|---|---|---|---|
| | | | | **සටහන-(vii)** |
| **<u>අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය</u>** | | | | |
| **අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව** | | | | |
| **වියදම් ශීර්ෂ අංකය: 281** | | | | |
| **වැඩසටහන් අංකය හා නාමය: 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | |
| **දිනය** | **වවුචර් අංකය** | **ආදායකයාගේ නම** | **ගෙවීමේ ස්වභාවය** | **ගණන (රු)** |
| | | | | |
| | | | | |
| | | | | |
| | | **හිස් වාර්තාවකි** | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

ඇටහන-**(vii)**

## අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

**අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**වියදම් ශීර්ෂ අංකය: 281**

**වැඩසටහන් අංකය හා නාමය: 2 - සංවර්ධන ක්‍රියාකාරකම්**

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | **හිස් වාර්තාවකි** | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය

# 2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2021.12.31 දිනට තත්ත්ව වාර්තාව

**වියදම් ශීර්ෂ අංකය:** 281

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| අනු අංකය | බැංකුවේ නම | විශිෂ්ඨ ගිණුම් අංකය | 2021.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | 2021.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය | 2021.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| | | | (රු.) | (රු.) | | |
| 1 | ලංකා බැංකුව-කොළඹ | 7042361 | 3,000.00 | - | 939,717.60 | 2021-දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව-ගම්පහ | 7042370 | 3,000.00 | - | 89,678.66 | 2021-දෙසැම්බර් |
| 3 | ලංකා බැංකුව-කළුතර | 7042362 | 3,000.00 | - | 412,625.71 | 2021-දෙසැම්බර් |
| 4 | ලංකා බැංකුව-මහනුවර | 7042351 | 224,058.69 | - | 25,268.60 | 2021-දෙසැම්බර් |
| 5 | ලංකා බැංකුව-මාතලේ | 7042366 | 3,000.00 | - | 97,751.67 | 2021-දෙසැම්බර් |
| 6 | ලංකා බැංකුව-නුවරඑළිය | 7042358 | 3,000.00 | - | 1,186,118.33 | 2021-දෙසැම්බර් |
| 7 | ලංකා බැංකුව-ගාල්ල | 7042359 | 3,000.00 | - | 141,530.68 | 2021-දෙසැම්බර් |
| 8 | ලංකා බැංකුව-මාතර | 7042347 | 3,000.00 | - | 177,688.20 | 2021-දෙසැම්බර් |
| 9 | ලංකා බැංකුව-හම්බන්තොට | 7042369 | 3,000.00 | - | 1,355,235.33 | 2021-දෙසැම්බර් |
| 10 | ලංකා බැංකුව-යාපනය | 7042353 | 3,000.00 | - | - | 2021-දෙසැම්බර් |
| 11 | ලංකා බැංකුව-මන්නාරම | 7042346 | 3,000.00 | - | 241,372.75 | 2021-දෙසැම්බර් |
| 12 | ලංකා බැංකුව-වවුනියාව | 7042356 | 3,000.00 | - | 914,585.44 | 2021-දෙසැම්බර් |
| 13 | ලංකා බැංකුව-මුලතිව් | 7042355 | 3,000.00 | - | 368,347.76 | 2021-දෙසැම්බර් |
| 14 | ලංකා බැංකුව-කිලිනොච්චි | 7042360 | 3,000.00 | - | 10,762.00 | 2021-දෙසැම්බර් |
| 15 | ලංකා බැංකුව-මඩකලපුව | 7042363 | 3,000.00 | - | 7,775.00 | 2021-දෙසැම්බර් |
| 16 | ලංකා බැංකුව-අම්පාර | 7042350 | 3,000.00 | - | 695,954.28 | 2021-දෙසැම්බර් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17 | ලංකා බැංකුව-ත්‍රිකුණාමලය | 7042354 | 3,000.00 | - | - | 2021-දෙසැම්බර් |
| 18 | ලංකා බැංකුව-කුරුණෑගල | 7042368 | 2,800.00 | - | 1,033,932.29 | 2021-දෙසැම්බර් |
| 19 | ලංකා බැංකුව-පූත්තලම | 7042349 | 3,000.00 | - | 1,081,011.28 | 2021-දෙසැම්බර් |
| 20 | ලංකා බැංකුව-අනුරාධපුරය | 7042352 | 88,000.00 | - | 13,750.00 | 2021-දෙසැම්බර් |
| 21 | ලංකා බැංකුව-පොළොන්නරුව | 7042367 | 3,000.00 | - | 7,895.00 | 2021-දෙසැම්බර් |
| 22 | ලංකා බැංකුව-බදුල්ල | 7042364 | 120,478.28 | - | 144,537.00 | 2021-දෙසැම්බර් |
| 23 | ලංකා බැංකුව-මොණරාගල | 7042365 | 3,000.00 | - | 108,997.50 | 2021-දෙසැම්බර් |
| 24 | ලංකා බැංකුව-රත්නපුරය | 7042348 | 3,000.00 | - | 42,231.76 | 2021-දෙසැම්බර් |
| 25 | ලංකා බැංකුව-කෑගල්ල | 7042357 | 228,000.00 | - | 300,530.00 | 2021-දෙසැම්බර් |
| 26 | ලංකා බැංකුව-ටොරින්ටන් චතුරස්‍රය | 7042345 | 3,000.00 | - | 1,614,534.97 | 2021-දෙසැම්බර් |

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි**

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :

# විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

ඒආර්අයි/බී/ඒඩීඩී/02/21/73 2022 ජුනි 22 දින.

කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

යථෝක්ත වාර්තාව හා සිංහල මූල්‍ය ප්‍රකාශනයේ පිටපත මේ සමඟ එවා ඇත.

ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් :-
01. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය
02. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් - විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ සිංහල පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

ඒඅාර්අයි/බී/ඒඩීඩී/02/21/73 2022 ජූනි 22 දින

කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම.**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවිය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ එකාවසක් ලෙස මා විසින් විගණනයේදී වැන්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ නීඩා දුස්සන්ධානයන්, විනාශ කල්බන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීම්වලින්, විරුද්ධා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව තහවුරු කිරීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| ප්‍රතිසංස්කරණය කරන ලද සුළු වාරිමාර්ග සංඛ්‍යාව හා අස්වද්දන ලද පුරන් කුඹුරු සංඛ්‍යාව | | √ | |
| ප්‍රතිසංස්කරණය කරන ලද ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල සංඛ්‍යාව | √ | | |
| අලුත්වැඩියා කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා සංඛ්‍යාව | | √ | |
| අළුතින් ඉදිකරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව | √ | | |
| අලුතින් ඉදිකරන ලද පොහොර ගබඩා සංඛ්‍යාව | | | √ |
| පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | √ | | |
| අලුත්වැඩියා කරන ලද යන්ත්‍රසූත්‍ර | | √ | |
| අත්පත් කර ගන්නා ලද යන්ත්‍රසූත්‍ර | | | √ |
| වාහන අලුත්වැඩියා කිරීම | | | √ |
| මිලදී ගන්නා ලද ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | √ | | |
| සුළු වාරිමාර්ග සඳහා නව ක්‍රම හඳුන්වා දීම | | | √ |
| වැඩිදියුණු කරන ලද ග්‍රාමීය එල්ලංගා පද්ධති සංඛ්‍යාව | √ | | |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 1. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.2 ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූලවන පරිදි සියළුම ආකාරයේ දරිද්‍රතාවයෙන් පෙලෙන සියළුම වයස් කාණ්ඩ වලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම. | 1.2.1 ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය. | √ | | |
| | | 1.2.2. ජාතික අර්ථ දැක්වීම් වලට අනුව දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාල තත්ත්වය තුල ජීවත්වන සියලු වයස් කාණ්ඩයන්ට අයත් පුරුෂ ස්ත්‍රී හා ළමා ජනගහනයේ ප්‍රමාණය. | √ | | |
| | 1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුලුව සියළුම පිරිමින්ට හා කාන්තාවනට 2030 වසර වන විට ආර්ථික සම්පත් මූලික සේවාවන් ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. | 1.4.1 මූලික සේවාවන් සහිත කුටුම්භයන්හි ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය. | | √ | |
| | | 1.4.2 ස්ත්‍රී පුරුෂ භාවය සහ හිමිකම් මාදිලියට අනුව නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය. | √ | | |
| | 1.5 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට ලක්විය හැකි තත්ත්වයේ සිටින්නන්ගේ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාළගුණික | 1.5.2 ලෝක දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානිය. | √ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තත්ත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම්ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නා වූ හානි සහ ආපදා වලට නිරාවරණයවීම ද අඩු කිරීම. | | | | |
| 2. සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයන්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සාමාන්‍ය ලෙස ප්‍රවේශවීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මඟින් දෙගුණ කිරීම. | 2.3.1 ගොවි/ගව පාලන/වනාන්තර ආශ්‍රිත කර්මාන්තයන් පන්තීන්හි විශාලත්වය අනුව ශ්‍රම ඒකකයක් සඳහා නිෂ්පාදන පරිමාව. | √ | | |
| | | 2.3.2 ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ සාමාන්‍ය ආදායම. | √ | | |
| | 2.4 2030 වන විට ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ කාලගුණ වෙනස්වීම් වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නාවූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියහ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | 2.4.1 ඵලදායී සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික බිම් ප්‍රමාණය. | √ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම | 6.3 2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩුකිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකරිව නැවත භාවිතා කිරීම. | 6.3.2 ගුණාත්මක භාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය. | √ | | |
| | 6.4 2030 වන විට සියලුම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම තිරසර අන්දමින් ජලය ලබාගැනීම සහ සැපයීම ජලය හිඟකම මඟහැරවීම සඳහා සහ ජලය හිඟ කමින් පීඩා විඳින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රාමාණික ලෙස අවම කිරීම. | 6.4.1 ජල භාවිතය කාර්යක්ෂමතාවයේ කාලානුරූපී වෙනස්වීම. | √ | | |
| | 6.5 2030 වන විට දේශ සීමා හරහා වූ සහයෝගය සුදුසු අන්දමින් උපයෝගී කරගනිමින් ඒකාබද්ධ ජල සම්පත් කළමණාකරණයක් සියලුම මට්ටම් වල ක්‍රියාවට නැංවීම. | 6.5.1 ඒකාබද්ධ ජල සම්පත් කළමණාකරණයක් සිදුවන මට්ටම. (0-100) | √ | | |
| 13. දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. | 13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදා වලට ඔරොත්තුදීමේ හා එවැනි තත්ත්වයන්ට මුහුණදීමේ හැකියාව ශක්තිමත් කිරීම. | 13.1.1 ජනගහනයේ පුද්ගලයන් ලක්ෂයකට හදිසි ආපදා හේතුවෙන් සිදුවන මරණ, අතුරුදහන්වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව | | √ | |
| | | 13.1.2 2015 – 2030 ආපදා අවධානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්යය රාමුවට අනුකූලව ජාතික අවදානම් අවම කිරීමේ | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව. | | | |
| | 13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම් වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුලත් කිරීම. | 13.2.1 ආහාර නිෂ්පාදනයට තර්ජනයක් නොවන පරිදි (ජාතික හැඩගැසීමේ සැලැස්මක්, ජාතික අධිෂ්ඨානශීලී දායකත්වය, ජාතික සන්නිවේදනය සහ අර්ධ වාර්ෂික යාවත්කාලීන වාර්තා සහ සෙසු දේ) දේශගුණික වෙනස්වීමේ අහිතකර බලපෑම් සඳහා හැඩගැසීමට ඔවුන්ගේ හැකියාව වැඩිකරන ඒකාබද්ධ ප්‍රතිපත්ති /ක්‍රමෝපාය / සැලසුම් සහ කාළගුණික වෙනස්වීම් හා හරිතාගාර වායු විමෝචනයන් අවම කිරීම් දියුණු කිරීම සඳහා වන කැපවීම පිළිබඳ අදහස් හුවමාරු කරගෙන ස්ථාපනය කර සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව. | √ | | |
| | 13.3 කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම. | 13.3.1 ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපන විෂයමාලා වලට අවම කිරීම, හැඩගැසීම, බලපෑම අවම කිරීම, සහ පූර්ව දැනුම්දීමේ ක්‍රම ඇතුලත් කර ඇති රටවල් සංඛ්‍යාව. | √ | | |
| 15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය | 15.1 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර් ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම. | 15.1.1 වන ආවරණය සමස්ත භූමි ප්‍රදේශයේ පංගුවක් ලෙස. | √ | | |
| | | 15.1.2 ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාරය අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය. | √ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් භායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | 15.3 2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියඟය, සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම්ද ඇතුළුව විනාශයට පත්වූ ඉඩම් සහ පස නැවත යථා තත්ත්වය පත්කිරීම සහ ඉඩම් විනාශයට පත් නොවන ලෝකයක් ඇති කිරීම. | 15.3.1 සමස්ථ භූමි ප්‍රමාණයෙන් භායනයට ලක්ව ඇති ප්‍රමාණය | √ | | |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග**

සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම යන අරමුණු සඳහා අදාළ වන 1.2, 1.4, හා 1.5 යන ඉලක්ක සපුරාගැනීමේදී ගොවි ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමත් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් යන කරුණු පෙරදැරිව සිතමු කාන්තා ගොවි සංවිධාන ඇති කරමින් ගොවි කාන්තාවන් හරහා තම පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගෙවතු වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මේ තුලින් රසායනික පොහොර භාවිතය අවම කරමින් කාබනික වගාවට නැඹුරු කරවීමත් වස විසෙන් තොර ආහාර පරිභෝජනයට අවස්ථාව සැලසීමත් පවුලේ ආර්ථිකයට ශක්තියක් වෙමින් අමතර ආදායමක් උත්පාදනය කරලීමත් සිදුවේ. වස විසෙන් තොර වූ ආහාර පරිභෝජනය තුලින් ලෙඩරෝග අවම කිරීම හා ඖෂධ සඳහා වැය වන විශාල මුදලක් ඉතිරි කරමින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් රටට දායාද කිරීමට හැකියාව මේ තුළින් උදා කෙරේ. එමෙන්ම කාන්තාවන්ගේ ව්‍යවසායක හැකියාවන් හඳුනාගෙන ඔවුන් ව්‍යවසායකයන් ලෙස ඵලදායී නිෂ්පාදන ක්‍රියාවලියට දායක කිරීමට හැකියාව ලැබී ඇත.

ඒ අනුව ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන ක්‍රියාත්මක කරමින් ඔවුන්ගේ ඉතුරුම් වලින් ගොඩනැඟුණු ප්‍රාග්ධන යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන ක්‍රියාත්මක කරමින් ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් සැලසීමට හැකියාව ලැබී ඇත.

අරමුණු අංක B6 යටතේ සෑමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම සඳහා ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වා දී ඇති අතර ඒ තුළින් වගාවට යොදා ගන්නා ජලයේ ගුණත්වය පරීක්ෂා කරයි.

එසේම කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීමත් තිරසර අන්දමින් ජලය ලබාගැනීම හා ජලය සැපයීම ජල හිඟකම මගහැරවීම සඳහාත් ජලය හිඟකමින් පීඩාවිඳින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රමාණික ලෙස අවම කිරීම සඳහා නවීන ජල කළමණාකරණ ක්‍රමවේදයන් භාවිතා කිරීම මේ වන විට උතුරු පළාත තුල නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවීම ලබාගත් සැලකිය යුතු ජයග්‍රහණයකි.

දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සහ සහශ්‍ර සංවර්ධන අරමුණට ලගාවීම සඳහා කාලගුණික වෙනස්වීම් අවම කිරීම, ඒ අනුව හැඩගැසීමට බලපෑම් අවම කිරීම හා පූර්ව අනතුරු සම්බන්ධයෙන් දැනුවත් භාවය ඉහල නැංවීම හා ඊට පූර්ව සූදානම ඇතිකිරීම හා මානව හා ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම වන ඉලක්ක සපුරා ගනිමින් ගංවතුර හා නියඟයෙන් වන බලපෑම් අවම කිරීම සඳහා පෙර අනතුරු ඇගවීම් සංඥා පද්ධතියක් හඳුන්වාදීමට හැකිවීම අප ලද ජයග්‍රහණයක් වේ. මේ සඳහා අවශ්‍ය වන පුහුණුව ලබාදීම හා යන්ත්‍ර උපකරණ සවිකිරීමේ කටයුතු දිවයින පුරා ගොවිජන

සේවා බල ප්‍රදේශ මට්ටමින් සිදුකර අවසන් අතර මේ තුළින් ලබාගන්නා දත්ත පාදක කරගනිමින් අදාළ ප්‍රදේශවල කාලගුණික දේශගුණික විපර්යාසයන් පිළිබඳ පෙර අනතුරු සංඥා ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරවීම ආරම්භ කිරීමට හැකිවී තිබීම ලද ජයග්‍රහණයකි. මේ තුළින් ගොවීන්ට ස්වභාවික ආපදාවලට මුහුණදීමේ හැකියාව හා ඉන් වන බලපෑම අවම කිරීමට හැකියාව ලැබෙනු ඇත.

තිරසර සංවර්ධන අරමුණු 15 යටතේ භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන කාරණා වලට අනුගත වන පරිදි එල්ලංගා පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම හා ඒ ආශ්‍රිත ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, වැඩිදියුණු කිරීම ක්‍රියාවට නංවා ඇත.

මීට සමගාමීව සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, වැව් ආශ්‍රිත වන වගාව හා රුක් රෝපණ වැඩසටහන්, ක්‍රියාත්මක කරමින් භූගෝලීය පරිසර පද්ධතීන් තිරසර භාවිතයට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.

<u>අභියෝග</u>

මේ සඳහා මුහුණදීමට ඇති අභියෝගයක් ලෙස මෙම ප්‍රවේශයන් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැතිවීම, නවීන තාක්ෂණ මෙවලම් හා ක්‍රමවේද භාවිතය සඳහා පාරම්පරික ගොවි ජනතාව හුරුකරවීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම, පුද්ගල ආකල්ප වෙනස් කිරීම සඳහා ඔවුන් නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකළ යුතු වීම. සැලසුම් සහගත සංවර්ධන ක්‍රියාවලියක් නොමැතිකම උදා:- ජනාවාසකරණය, නාගරීකරණය සැලසුම් සහගත අයුරින් සිදුනොවීම.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 121 | 80 | 41 |
| තෘතියික | 640 | 477 | 163 |
| ද්විතීයික | 14922 | 12029 | 2893 |
| ප්‍රාථමික | 1564 | 1277 | 267 |

### 06.2

- ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී පුරප්පාඩු පුරප්පාඩු 41 ක් පැවතිය ද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් සේවය සඳහා බඳවාගෙන ඇති අතර, වැඩබැලීමේ කටයුතු සඳහා ද නිලධාරීන් යොදවා ඇත. කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

- තෘතියික මට්ටමේ නිලධාරී පුරප්පාඩු 163 ක් පැවතිය ද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පවතින ගො.සේ.ම සඳහා ගොවිජන සංවර්ධන නිලධාරීන් වැඩබැලීමේ කටයුතු සඳහා පත් කර ඇත. තාක්ෂණික නිලධාරී තනතුරේ පුරප්පාඩු 05 ක් හා ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරේ පුරප්පාඩු 37 ක් 2022 වර්ෂයේදී බඳවා ගැනීමට නියමිතව ඇත.

- ද්විතීයික මට්ටමට අයත් කෘ.ප.නි.ස, මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුරුවල පුරප්පාඩු පවතින සේවා ස්ථාන සඳහා වැඩබැලීමට නිලධාරීන් යොදවා ඇත. ඒ තුළින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කර ඇත. තාක්ෂණික සහායක තනතුරේ පුරප්පාඩු 35 ක්, කෘ.ප.නි.ස තනතුරේ පුරප්පාඩු 1057 ක් සහ මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුරේ පුරප්පාඩු 256 ක් 2022 වර්ෂයේදී බඳවා ගැනීමට නියමිතව ඇත.

- ප්‍රාථමික මට්ටමේ නිලධාරී පුරප්පාඩු 267 ක් පැවතියද බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන්ගේ සේවය යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | සම්මත ආයෝජනය (Rs'000) | | වැඩසටහන ස්වභාවය දේශීය/ විදේශීය | නිමැවුම ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 01 | කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය වැඩමුළුව 03 | 162 | දින 01 | 156266 | | දේශීය | නවක නිලධාරීන්ගේ කාර්යාල කටයුතු වල කාර්යක්ෂමව ඵලදායිතාවය ඉහළ නැංවීම |
| 02 | ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ පුහුණු වැඩමුළුව | 20 | දින 04 | 216356 | | දේශීය | නිවැරදි ලෙස ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමේ හැකියාව ලබා දීම |
| 03 | නවක විනිශ්චය සභා නිලධාරීන් සඳහා නීති පුහුණුව | 13 | දින 01 | 56067 | | දේශීය | නවක විනිශ්චය සභා නිලධාරීන්ට විනිශ්චය සභා කටයුතු සිදු කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම |
| 04 | මූලික විමර්ශන පුහුණු වැඩසටහන 1 අදියර පලමු සැසිය | 46 | දින 03 | 0 | | දේශීය | මූලික විමර්ශනයක නිරවද්‍යතාවය ඉහළ නැංවීම |
| 05 | මූලික විමර්ශන පුහුණු වැඩසටහන 2 අදියර 1 සැසිය(zoom meeting) | 46 | දින 03 | 0 | | දේශීය | මූලික විමර්ශනයක නිරවද්‍යතාවය ඉහළ නැංවීම |
| 06 | ගොවිජන බැංකු ව්‍යාපෘති සහකාර නිලධාරීන්,විමර්ශන නිලධාරීන් වශයෙන් අනුගත කිරීමේ පුහුණු වැඩමුළුව | 30 | දින 02 | 0 | | දේශීය | ගොවිජන බැංකු ව්‍යාපෘති සහකාර නිලධාරීන් විමර්ශන නිලධාරීන් වශයෙන් අනුගත කිරීම |
| 07 | මූලික විමර්ශන පුහුණු වැඩසටහන 2 අදියර 2 සැසිය - භූමිකාරංගනය (zoom meeting) | 46 | දින 03 | 0 | | දේශීය | මූලික විමර්ශනයක් පැවැත්වීමේ නිරවද්‍යතාවය ඉහළ නැංවීම |
| 08 | පශ්චාත් උපාධිපාඨමාලා ගාස්තු ගෙවීම | 11 | අවු 01 | 160000 | | දේශීය | නිලධාරීන්ගේ උසස් වීම් සඳහා හා තනතුරට අවශ්‍ය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | සුදුසුකම් සපුරා ගැනීම |
| 09 | ගො.ස. නි/ස.කොා. සඳහා වන නීති පුහුණු වැඩමුළුව | 25 | දින 02 | 109000 | | දේශීය | ගොවිජන නීතිය හා ඒ හා සම්බන්ධ නීතිය සම්බන්ධයෙන් මතුවන ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව වර්ධනය වීම |
| 10 | මූලික පරිගණක පුහුණු වැඩසටහන කෑගල්ල - 01 කණ්ඩායම | 15 | දින 03 | 121906.50 | | දේශීය | නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාව වර්ධනය කිරීම |
| 11 | මූලික පරිගණක පුහුණු වැඩසටහන කෑගල්ල - 02 කණ්ඩායම | 15 | දින 03 | 117394 | | දේශීය | නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාව වර්ධනය කිරීම |
| 12 | කෙටි කාලීන පාඨමාලා සඳහා | 05 | දින 03 | 35000 | | දේශීය | විෂයට අදාළ දැනුම ලබා දීම |

ආයතනයේ දැක්ම හා මෙහෙවර කරා ලගා වීමට නිලධාරීන් විසින් ඉටුකල යුතු වගකීම් හා කාර්යයභාරය උදෙසා නිලධාරින් සතු දැනුම හැකියාව හා කුසලතා පුහුණු වැඩසටහන් හරහා වර්ධනය කර ඉලක්ක කරා ලගා වීමට නිලධාරීන් යොමු කිරීම තුළින් ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් මඟින් විශාල දායකත්වයක් ලබා දිය හැකිය.

## 07 පර්ච්ඡේදය - අනුකූලතා වාර්තාව

| ඡේද අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| **1.1** | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| **1.2** | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| **1.3** | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| **1.4** | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | - | - |
| **1.5** | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | - | - |
| **1.6** | වෙනත් | - | - | - |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ.445)** | | | |
| **2.1** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.2** | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.3** | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.4** | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.5** | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| **2.6** | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.9** | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **2.10** | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | - | මෙතෙක් අදාල ලේඛනය ප්‍රකාරව යාවත්කාලීන කර නොමැති අතර, ඉදිරියේදී ( GAN – 20) ලේඛනය ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු.රෙ. 135)** | | | |
| **3.1** | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම | අනුකූල වේ | - | - |
| **3.2** | මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **3.3** | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| **3.4** | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මaදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| **4.1** | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| **4.2** | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| **4.3** | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| **4.4** | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| **4.5** | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **5** | **විගණන විමසුම** | | | |
| **5.1** | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | දිවයින පුරා විසිරී පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 565ක් හා දිස්ත්‍රික්ක කාර්යාල 25ක් සහ | විගණන විමසුම අදාල වන විෂය පථය පදනම් කර ගනිමින් අදාල විගණන විමසුම් සඳහා පැහැදිලි |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රධාන කාර්යාලයේ අංශ 17ක් සඳහා ප්‍රාදේශීය විගණන අංශ මඟින් සහ දෙපාර්තමේන්තු විගණන අංශය මඟින් විගණන විමසුම් ඉදිරිපත් කරනු ලබයි. මෙසේ ඉදිරිපත් කරනු ලබන සියලු විගණන විමසුම් වෙනුවෙන් අදාල පැහැදිලි කිරීම් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් කැඳවා අදාල තොරතුරු තහවුරු කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරනු ලැබේ. ප්‍රධාන කාර්යාලය විසින් එම පැහැදිලි කිරීම් තවදුරටත් තහවුරු කර ගැනීමෙන් හා සනාථ කිරීමෙන් අනතුරුව අවසන් පිළිතුරු සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දින 14ක නිශ්චිත කාලය ප්‍රමාණවත් නොවේ. | කිරීම් ඉදිරිපත් කිරීමට සැලකිය යුතු සාධාරණ කාලයක් නිර්ණය කිරීම. |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| **6.1** | මු.රෙ.134(2) DMA-2019 අනුව වසර ආරම්භයේදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **6.2** | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන වාර්තාවලට පිළිතුරු ලබා ගැනීම දිස්ත්‍රික්කය භාරව කටයුතු කරන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් මඟින් සිදු කරන අතර, නි/සහකාර. කොමසාරිස්වරුන් වෙත යොමු කරන අභ්‍යන්තර විගණන වාර්තාව ගොවිජන සංවර්ධන නිලධාරීන් වෙත යොමු කර පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීම් කර, පිළිතුරු ලබා දීම සිදු කරයි. එසේ පිළිතුරු ලබා දීමේ දී මාසයකට අධික කාලයක් ගත වන බව දන්වා සිටිමි. | 1. "නිලදිරිය" දිස්ත්‍රික් කාර්යාල ධාරිතා සංවර්ධන වැඩ සටහන යටතේ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම පරීක්ෂා කර, ඒ සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම.<br><br>2. ඒ තුළින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට නිලධාරීන් දිරිමත් කිරීම |
| **6.3** | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **6.4** | මු.රෙ.134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| **7.1** | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් 4 ක් වත් අදාල වර්ෂය තුල පවත්වා ගෙන තිබීම | අනුකූල නොවේ | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රැස්වීම් 03 ක් පමණක් පැවැත් වීමට හැකි විය | - - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **8.1** | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **8.2** | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | - | - |
| **8.3** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **8.4** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| **8.5** | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම. | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| **9.1** | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| **9.2** | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ. | දිස්ත්‍රික් කාර්යාල 25හිම අපහරණය කල යුතු වාහන පවතින බැවින් ඒවා එක් තැනකට ගාල් කර අපහරණය සිදු කරන විට මාස 06 කට වඩා වැඩි කාලයක් ගතවේ. | එක් එක් දිස්ත්‍රික් කාර්යාලය සතු වාහන දිස්ත්‍රික් කාර්යාල මට්ටමෙන් අපහරණය කිරීමට කටයුතු කිරීම. |
| **9.3** | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| **9.4** | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| **9.5** | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | | | |
| **9.6** | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ. | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| **10.1** | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **10.2** | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | මාස 06 ඉක්ම වූ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් පැවතීම | මු.රෙ. 396 ප්‍රකාරව චෙක්පත් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| **11.2** | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසනලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| **12.1** | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| **12.2** | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | - | - |
| **12.3** | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | දිස්ත්‍රික් කාර්යාල මඟින් දැනුවත් කළ ද නිලධාරීන් ගෙවීම් පැහැර හැරීම සහ විශ්‍රාමික නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල අඩුපාඩු පැවතීම. | නිරන්තරයෙන් දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ණය අයකර ගැනීමට කටයුතු සැලසුම් කිරීම. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| **13.1** | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල නොවේ | ප්‍රමාණවත් මුදල් නොමැති වීම මත නිරවුල් කිරීමට | අක් මුදල් ලැබීම මත නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නොහැකි තැන්පතු පැවතීම. | |
| **13.2** | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| **14.1** | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| **14.2** | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **14.3** | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **14.4** | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| **15.1** | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| **15.2** | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| **15.3** | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| **16.1** | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව ේ අනුමත කාර්යය මණ්ඩලය තුළ පුරප්පාඩු පැවතීම | දැනට අයදුම්පත් කැඳවා ඇති සියලු තනතුරුවල බඳවා ගැනීම් කඩිනම් කිරීම |
| **16.2** | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **16.3** | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **17.1** | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **17.2** | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ මහජන ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා නැත | එම පහසුකමද ඇතුළත් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම |
| **17.3** | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| **18.1** | අංක 05/2008 හා 05/2018(I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | මෙතෙක් සකස් කර නොමැති අතර ඉදිරියේදී සකස් කිරීමට නියමිතව ඇත | පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම තුළින් දෙපාර්තමේන්තු වේ කාර්යසාධනය ඉහළ නැංවීම |
| **18.2** | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මෙතෙක් සකස් කර නොමැති අතර ඉදිරියේදී සකස් කිරීමට නියමිතව ඇත | පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීම තුළින් දෙපාර්තමේන්තු වේ කාර්යසාධනය ඉහළ නැංවීම |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| **19.1** | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | රටේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිසි පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය | 2022 වර්ෂයේදී නියමිත පරිදි පුහුණු වැඩසටහන් පවත්වා මානව සම්පත් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම | අනුකූල වේ | | |
| **19.4** | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |